සහනාධාර චක්‍රලේඛ අංක - 83

අපේ අංකය : සං/01
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
අංක 70, පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
2021/02/16

සියලුම ප්‍රාදේශීය කළමණාකරුවන්

**ආසියානු සංවර්ධන බැංකු ණය යෝජනා ක්‍රමය යටතේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය සවිබල ගැන්වීම යටතේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය**

## 1. හැඳින්වීම.

සෞභාග්‍යයේ දැක්ම වැඩසටහන යටතේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය සවිබල ගැන්වීම උදෙසා ආසියානු සංවර්ධන බැංකු ණය යෝජනා ක්‍රමය තුලින් කුඩා තේ වතු අංශයේ නිෂ්පාදනය වර්ධනය කිරීමත් කුඩා තේ වතු හිමි ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ දැමීමත් අරමුණු කර ගනිමින් යහපත් කෘෂි කාර්මික පිළිවෙත් උපයෝගී කර ගැනීමට සකස් කරන ලද ව්‍යාපෘති යෝජනා සඳහා සුදුසුකම් ලත් මූල්‍ය ආයතන 10 ක් හරහා ණය පහසුකම් ලබාදෙනු ලැබේ.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත ක්ෂේත්‍ර පහත පරිදි වේ.

- තේ නැවත වගාව
- තේ අළුත් වගාව
- පාළු සිටුවීම
- තේ වගාවේ ජල සම්පාදනය
- තේ තවාන් සංවර්ධනය
- තේ වගාවේ යාන්ත්‍රීකරණය

### 1.1. කුඩා තේ වතු අංශයේ ප්‍රතිලාභීන්.

අක්කර 10 ට වඩා අඩු වපසරියකින් යුත් තේ ඉඩම් හිමි කුඩා තේ වතු හිමියන්

### 1.2. ණය ආපසු ගෙවීමේ කාල සීමාව.

ණය ආපසු ගෙවීමේ කාල සීමාව වසර 10 කි.

### 1.3. ණය ආපසු ගෙවීමේ දී සහන කාලය.

- තේ නැවත වගාව හා අළුත් වගාව සඳහා ණය ආපසු ගෙවීමේ දී මුළු ණය මුදල ආපසු ගෙවීමේ කාලසීමාවෙන් පළමු වසර දෙක සහන කාලයක් වශයෙන් ලබා දෙනු ලැබේ.
- පාළු සිටුවීම, තේ වගාවේ ජල සම්පාදනය, තේ තවාන් සංවර්ධනය හා යාන්ත්‍රීකරණය සඳහා ණය ආපසු ගෙවීමේ දී මුළු ණය මුදල ආපසු ගෙවීමේ කාලසීමාවෙන් පළමු වසර එකක් සහන කාලයක් වශයෙන් ලබා දෙනු ලැබේ.

### 1.4. ලබාගත හැකි උපරිම ණය මුදල .

ව්‍යාපෘතිය යටතේ ලබාගත හැකි උපරිම ණය මුදල රුපියල් මිලියන 30 ක් වන අතර උපරිම ණය සීමාව යටතේ එක් ණය ඉල්ලුම්කරුවෙකුට ව්‍යාපෘති කිහිපයකට ණය පහසුකම් ලබා ගත හැක.

## 1.5. පොලී අනුපාතය .

ණය යෝජනා ක්‍රමය යටතේ ණය පොලී අනුපාතය 4.5% - 5% ත් වන අතර මෙම පොලී අනුපාතය වෙළඳපොල තත්ත්වයන් මත පදනම්ව සෑම මාස 6 කට වරක් ම යාවත්කාලීන වනු ඇත. කෙසේ වුවද කිසියම් ණය ඉල්ලුම්කරුවෙකුගේ ණය මුදලක් අනුමත කිරීමේ දී මූල්‍ය ආයතනය හා ණයකරු අතර එකගවන පොලී අනුපාතය එම ණය මුදල ගෙවා අවසන් වන තුරු නොවෙනස්ව පවතී.

## 1.6. ණය පහසුකම් සපයන මූල්‍ය ආයතන.

ලංකා බැංකුව, මහජන බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, හැටන් නැෂනල් බැංකුව, ජාතික සංවර්ධන බැංකුව, කොමර්ෂල් බැංකුව, DFCC බැංකුව, සෙලාන් බැංකුව, සම්පත් බැංකුව හා, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව

## 1.7. ණය මුදල් නිදහස් කිරීම.

ණය මුදල් නිදහස් කිරීමේ දී අදාල ණය පහසුකම් සපයන ආයතනය විසින් ඉදිරිපත් කරන ණය වාරිකය නිර්දේශ කිරීමට අවශ්‍ය පෝරමය හා ණය ඉල්ලුම්කරු විසින් මූල්‍ය ආයතනය වෙත ඉදිරිපත් කරන ලද ණය ඉල්ලුම්පතෙහි පිටපතක් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය වෙත ලබාදුන් පසු කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී විසින් නිර්දේශ කර අදාල ප්‍රාදේශීය කළමණාකරු විසින් සහතික කොට නැවත ණය පහසුකම් සපයන මූල්‍ය ආයතනය වෙත ඉදිරිපත් කළ යුතුය.

## 1.8. අක්කර 10 වඩා අඩු තේ ඉඩම් හිමි කුඩා තේ ගොවීන් සඳහා ණය මත ප්‍රදාන ලබාදීම.

- අක්කර 10 අඩු තේ ඉඩම් හිමි කුඩා තේ ගොවීන්ට මෙම ණය මත ප්‍රදාන ලබා දෙනු ඇත.
- මෙම ප්‍රදානය තේ නැවත වගාව හා අළුත් වගාව සඳහා පමණක් ලබාදෙනු ලැබේ.
- ප්‍රදානය මුළු ණය මුදලේ ප්‍රාග්ධන අගයෙන් 10% - 20% ක අඩු කිරීමකි.
- මුළු ප්‍රදානයම ලබාගැනීම සඳහා ණය ඉල්ලුම්කරු විසින් මූල්‍ය සාක්ෂරතාවය පිලිබඳව පුහුණුව ලබාගත යුතුය.

# 2. ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය.

## 2.1. තේ නැවත වගාව හා අළුත් වගාව සඳහා ණය පහසුකම් ලබා දීම.

තේ නැවත වගාව හා අළුත් වගාව සඳහා ණය පහසුකම් ලබාගත හැකි උපරිම ණය සීමාව හෙක්ටයාරයකට රු. මිලියන 2.5 කි. වගා සහනාධාර ලබා ගන්නා ප්‍රතිලාභීන්ට සහනාධාර මුදල අඩු කොට ණය මුදල ලබා ගත හැක.

උදා. සහනාධාර මුදල හෙක්ටයාරයකට රු. 500,000.00 වන විට හෙක්ටයාරයක් සඳහා ලබා ගත හැකි ණය මුදල රු. 2,000,000.00 කි.

## 2.2. තේ වගාවේ පාලු සැපයීම සඳහා ණය පහසුකම් ලබා දීම.

පාලු සැපයීම සඳහා ණය පහසුකම් ලබාගත හැකි උපරිම ණය සීමාව හෙක්ටයාරයකට රු. 400,000/= කි. .

## 2.3. තේ තවාන් සංවර්ධනය සඳහා ණය පහසුකම් ලබා දීම.

තේ තවාන් සංවර්ධනය සඳහා ණය පහසුකම් ලබා දීමේ දී පහත කොන්දේසි යටතේ ක්‍රියාකල යුතු වේ.

2.3.1. පැල 100,000 ක තවානක් සඳහා උපරිම ණය සීමාව රු. 2,000,000/= කි.

2.3.2. ණය ඉල්ලුම්කරු වානිජ තේ තවාන් පිහිටුවීම සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිය ලබා ගත යුතුය.

2.3.3. ණය වාරික ගෙවීම තවාන් කුටීරය සැකසීම හා රිකිලි සිටුවීම යන අවස්ථාවලදී සිදුකරනු ලැබේ.

2.3.4. අධිකාරියේ තවාන් 500 ව්‍යාපෘතිය යටතේ සහනාධාර ලබා ගෙන ඇත්නම් එම තවාන සඳහා ණය ඉල්ලුම් කළ නොහැක.

2.4. **තේ ඉඩම් වල ජල සම්පාදන ක්‍රම ස්ථාපිත කිරීම සඳහා ණය පහසුකම් ලබාදීම.**

තේ ඉඩම්වල ජල සම්පාදන ක්‍රම ස්ථාපිත කිරීම සඳහා ණය පහසුකම් ලබා දීමේ දී උපරිම ණය සීමාව හෙක්ටයාරයකට රු. 800,000 කි. මෙම ණය පහසුකම ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ව්‍යාපෘති නිර්දේශ කිරීමේ දී පහත නිර්නායක උපයෝගී කරගනිමින් නිර්දේශ ලබා දිය යුතුය.

- තේ වගාවේ වයස අවුරුදු 15 ට වඩා අඩු විය යුතුය.
- තේ වගා භූමියට ජල මූලාශ්‍ර පැවතීම හා එම මූලාශ්‍රවල ජල ධාරිතාවය ප්‍රමාණවත් බව තහවුරු කල යුතුය.

ඉහත නිර්ණායකයන්ට අනුකූලව තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරිගේ නිර්දේශය හා ප්‍රා. කළමණාකරුගේ සහතිකය මත මුළු ණය මුදල එකවර නිදහස් කරනු ලැබේ.

2.5. **තේ වගාවේ ක්‍රියාකාරකම් යාන්ත්‍රීකරණය සඳහා යන්ත්‍ර හා උපකරණ මිල දී ගැනීම සඳහා ණය පහසුකම් ලබා දීම.**

- උපරිම ණය මුදල රු. 500,000.00 කි.
- තේ වගාවේ දළු කැඩීමේ යන්ත්‍ර කප්පාදු යන්ත්‍ර වලවල් හැරීමේ යන්ත්‍ර ඇතුලුව තේ පර්යේෂණායතනය නිර්දේශ කරනු ලබන තේ වගා යාන්ත්‍රීකරණයට අවශ්‍ය යන්ත්‍රෝපකරණ සඳහා ණය පහසුකම් ලබා ගත හැක.
- දැනට ලබා ගෙන ඇති ණය මුදල් ගෙවා අවසන් කිරීම සඳහා මෙම ණය මුදල යොදා ගත නොහැක.

**3. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ කාර්යයභාරය හා වගකීම.**

3.1. **ණය මුදලේ පළමු වාරිකය නිර්දේශ කිරීම.**

- මූල්‍ය ආයතනය විසින් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය වෙත එවන පළමු වාරිකය සඳහා නිර්දේශ ලබා ගැනීමේ පෝරමය හා ණය ඉල්ලුම්පතෙහි පිටපත ලද පසු කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය SMELoC-01 පෝරමය එදිනම ණය ඉල්ලුම්කරු මගින් සම්පූර්ණ කර එය පරිගණක ගත කල යුතුය.
- සම්පූර්ණ කරන ලද SMELoC-01 පෝරමයේ පිටපතක් , මූල්‍ය ආයතනය විසින් එවන ලද පළමු වාරිකය නිර්දේශ කිරීමට නියමිත පෝරමය හා මූලික පරීක්ෂණ වාර්තාවට (SMELoC - 02) අදාල පෝරමය ව්‍යාපෘතිය පරීක්ෂා කිරීම සඳහා තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරි මහතා වෙත යොමු කල යුතුය.
- සම්පූර්ණ කරන ලද මූලික පරීක්ෂණ වාර්තාව (SMELoC - 02) හා මූල්‍ය ආයතනය විසින් එවන ලද පෝරමයේ තොරතුරු ඇතුලත් කර එම පෝරමය ව්‍යාපෘතියට අදාල නිර්නායක වලට අනුව නිර්දේශ කර තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරි විසින් ප්‍රාදේශීය කර්යාලය වෙත ආපසු භාරදිය යුතුය.
- ඉන් අනතුරුව තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරි විසින් නිර්දේශ කරන ලද පෝරමය ප්‍රාදේශීය කළමණාකරු සහතික කොට වගාවේ ඉදිරි කටයුතු දැනුම් දෙන පෝරමය (SMELoC – 03) සම්පූර්ණ කර එහි පිටපතක් ද සමග මූල්‍ය ආයතනය වෙත යැවිය යුතු වන අතර එම නිර්දේශ කිරීම පිළිබඳ ව දත්ත පද්ධතියේ සටහන් කල යුතුය.
- අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාලය මගින් වාරික මුදල නිර්දේශ කළේ ද නැද්ද යන්න ණය ඉල්ලුම්කරු වෙත ඉදිරි වැඩ කටයුතු දැනුම් දෙන පෝරමය සමග දැනුවත් කල යුතුය. එසේම දැනුම් දී ඇති පරිදි ඉදිරි වැඩ කටයුතු නියමාකාර ලෙස සම්පූර්ණ නොකළ හොත් දෙවන වාරිකය නිර්දේශ කිරීමට හැකියාවක් නොමැති බවද දැනුම් දිය යුතුය.
- ඉහත නිර්දේශ මත මූල්‍ය ආයතනය විසින් ණය වාරික මුදල් නිදහස් කිරීමට කටයුතු කරනු ඇත.
- පළමු වාරිකය නිදහස් කිරීමෙන් මාස 6 කට පසු තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරි විසින් පස පුනරුප්ථාපනය සහිත තේ නැවත වගා ඉඩම් පරීක්ෂාවට ලක්කර නිර්දේශිත පරිදි පස පුනරුප්ථාපනය සඳහා තෘණ වගා කර

ඇති බවට SMELoC – 02(1) පෝරමය මගින් ප්‍රාදේශීය කළමණාකරු වෙත වාර්තා කල යුතුය. (දෙවන වාරිකය සඳහා නිර්දේශ ලබාදීමේ දී මෙම වාර්තාව පදනම් කර ගත යුතුය)

3.2. **ණය මුදලේ දෙවන වාරිකය නිර්දේශ කිරීම.**

- මූල්‍ය ආයතනය විසින් ඉදිරිපත් කරන දෙවන ණය වාරිකය නිර්දේශ කරන පෝරමය හා අධිකාරියේ ගෙවීම් පරීක්ෂණ වාර්තාවට (SMELoC – 02(2)) අදාල පෝරමය කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාලය විසින් තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී වෙත යොමු කළ යුතුය.
- තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී විසින් SMELoC-01 පෝරමයේ දැක්වෙන සැලැස්මට අනුව ව්‍යාපෘතියේ කටයුතු සිදුකර ඇති බවට තහවුරු වන්නේ නම් පරීක්ෂණ වාර්තාව සම්පූර්ණ කර දෙවන ණය වාරිකය නිර්දේශ කර ප්‍රාදේශීය කාර්යාලයට භාරදිය යුතුය. (තේ නැවත වගා / අළුත් වගා / පාළු සැපයීම යන ව්‍යාපෘති සඳහා නියමිත පරිදි පැල සිටුවා අවසන් කිරීමෙන් පසු දෙවන වාරිකය නිර්දේශ කළ යුතු වන අතර තේ නැවත වගාවේ දී පස පුනරුජ්ජීපන පරීක්ෂණයේ ප්‍රතිඵල ද මේ සඳහා අදාල කර ගත යුතුය)
- තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී විසින් නිර්දේශ කරන ලද මූල්‍ය ආයතනය වෙත යැවිය යුතු පෝරමය ප්‍රාදේශීය කළමනාකරු සහතික කොට අදාල මූල්‍ය ආයතනය වෙත යැවිය යුතුය.

3.3. **කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් ඒ ඒ නිලධාරීන්ගේ වගකීම යටතේ පහත ක්‍රියාකාරකම් ඉටු කල යුතුය.**

| | ක්‍රියාකාරකම | වගකීම | ගත වන කාලය |
|---|---|---|---|
| 01. | ණය යෝජනා ක්‍රමය පිළිබඳව කුඩා තේ ගොවීන් දැනුවත් කිරීම | ප්‍රා. කළමණාකරු / ස. ප්‍රා. කළමණාකරු(සං) / කළාප සංවර්ධන නිලධාරී / තේ පරීක්ෂක/ ව්‍යාප්ති නිලධාරී | දින 30 |
| 03. | ණය මුදල් නිදහස් කිරීම සඳහා තාක්ෂණික නිර්දේශ ලබා දීම | ප්‍රා. කළමණාකරු / තේ පරීක්ෂක/ ව්‍යාප්ති නිලධාරී | වැඩ කරන දින 7 ක් ඇතුලත |
| 04. | ණය ලබා දුන් ව්‍යාපෘතිවල ප්‍රගතිය මාසිකව පසුවිපරම් කිරීම | ස. ප්‍රා. කළමණාකරු (සං) | දින 7 ක් ඇතුලත |
| 05. | ණය පහසුකම් ලබා දෙන මූල්‍ය ආයතන වෙත ලබා දුන් නිර්දේශ පිළිබඳව දෛනිකව ප්‍රධාන කාර්යාලය විසින් දත්ත පද්ධතිය මගින් නියමුකරණය කරනු ලැබේ | කළමණාකරු (සැ.නි.) | දෛනිකව |

**4. වෙනත් කරුණු.**

(i) තේ නැවත වගාව, අළුත් වගාව හා පාලු සැපයීම සඳහා ණය පහසුකම් ලබා ගැනීමේ දී කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සහනාධාර ක්‍රමය යටතේ අවසරපත්‍රයක් ලබා ගැනීම අනිවාර්යය නොවේ. එහෙත් 2020 වසරේ හෝ ඊට පසුව අධිකාරියේ සහනාධාර අවසරපත්‍රයක් ලබා ගෙන මෙම ණය මුදල් ලබා ගන්නා අයකු හට ණය මුදලින් සහනාධාර හිමිකම් ලබන මුදල අඩු කොට ඉතිරි මුදල ණය පහසුකම වශයෙන් ලබා ගත හැක.

(ii) ණය මුදල් ඉල්ලුම් කරන අවස්ථාවේ දී අධිකාරියේ සහනාධාර අවසර පත්‍රයක් ක්‍රියාත්මක ව පවතී නම් එම අවසරපත්‍රය යටතේ සිදු කරන පරීක්ෂණ වාර්තා අනුව මෙම ණය වාරික ගෙවීම් නිර්දේශ කිරීම සඳහා කටයුතු කළ හැක (ණය නිර්දේශ කිරීම සඳහා නැවත පරීක්ෂණ සිදු කිරීම අවශ්‍ය නොවේ).

(iii) යොමු අංකය සකස් කිරීම SME/ණය යෝජනා ක්‍රමය / ප්‍රාදේශීය කාර්යාල කේතය / තේ පරීක්ෂක කොට්ඨාශය / වසර / අනු අංකය

උදා. SME/RP/RAT/AYAG/2021/1 අනු අංකය තේ පරීක්ෂක කොට්ඨාශයක් තුල වාර්ෂිකව අනු අංකයක් වශයෙන් යෙදිය යුතුය.

(iv) එක් එක් ණය ඉල්ලුම්කරු වෙනුවෙන් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල වල වෙන වෙනම ගොනුවක් ආරම්භ කළ යුතු වන අතර එම ගොනුවේ පහත සඳහන් ලේඛන නඩත්තු කොට පවත්වාගෙන යා යුතුය.

- ණය ඉල්ලුම්කරු විසින් සම්පූර්ණ කරන ලද SMELoC-01 අයදුම්පත.
- මූල්‍ය ආයතනය වෙත ණය ඉල්ලුම්කරු විසින් භාර දී ඇති ඉල්ලුම්පත්‍රයේ සහතික කළ පිටපතක්
- මූල්‍ය ආයතනය විසින් ණය වාරික මුදල් නිර්දේශ කිරීම සඳහා එවන ලද පෝරම තේ පරික්ෂක/ව්‍යාප්ති නිලධාරී හා ප්‍රාදේශීය කළමනාකරු විසින් සහතික කිරීමෙන් අනතුරුව ඒවායේ පිටපත්.
- තේ පරික්ෂක/ව්‍යාප්ති නිලධාරී විසින් සහතික කරන ලද සියලුම පරික්ෂණ වාර්තා .

(v) ණය මුදල ලබා ගන්නා ඉඩම සඳහා අධිකාරියේ සහනාධාර අවසරපත්‍රයක් ලබා ගන්නේ නම් ඉහත iv හි සඳහන් ලේඛණ එම ගොනුවට ඇතුලත් කළ යුතු අතර එම ගොනුවේ ඉදිරිපස බැංකු ණය ක්‍රමයට අදාල යොමු අංකය සටහන් කල යුතුය.

(vi) කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ කලාප සංවර්ධන නිලධාරීන් අදාල කලාප බල ප්‍රදේශයේ පවතින ඉහත 1.6 හි සඳහන් බැංකු ශාඛාවන් සමග සම්බන්ධීකරණය කරමින් කුඩා තේ වතු හිමියන් වෙත ණය ලබා දීමේ කටයුතු සාර්ථකව සිදු කල යුතුය

(vii) කුඩා තේ වතු සංවර්ධන සමිති මගින් මෙම ණය මුදල් ලබා ගැනීම සඳහා ගොවීන් දැනුවත් කිරීම හා පෙළඹවීම සිදු කල යුතුය.

මහින්ද විදානපතිරණ
සභාපති

පිටපත් :

1.) ලේකම් - වැවිලි අමාත්‍යාංශය
2.) ලේකම් - සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා හා කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
3.) සාමාන්‍යාධිකාරී
4.) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සංවර්ධන / ව්‍යාප්ති)
5.) අභ්‍යන්තර විගනක
6.) කළමනාකරු (සැලසුම් හා නියමුකරණ)
7.) සියලුම මාණ්ඩලික නිලධාරීන්
8.) සියලුම කලාප තේ සංවර්ධන නිලධාරීන්
9.) සියලුම තේ පරිකෂක / ව්‍යාප්ති නිලධාරීන්
10.) ගරු සභාපති/ලේකම් සමස්ත ලංකා සමිති සංවිධානය

**SMELoC - 01**

# 'සෞභාග්‍යයේ දැක්ම' කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය සවිබල ගැන්වීම

## කුඩා තේ වතු අංශය සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

යොමු අංකය :.............................................. (කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

ණය ඉල්ලීමට අපේක්ෂිත යෝජනා ක්‍රමය

| | |
|---|---|
| තේ නැවත වගා ක්‍රමය | |
| තේ අළුත් වගා කිරීම | |
| වගා පුනරුත්ථාපනය / පාළු සැපයීම | |
| තේ තවාන් සංවර්ධනය | |
| තේ වගාවේ ජල සම්පාදනය | |

ඉහත ඉල්ලුම් කරන ණය යෝජනා ක්‍රමයට අමතරව කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සහනාධාර ක්‍රමය යටතේ තේ නැවත වගා / අළුත් වගා / පාලු සිටවීම සඳහා සහනාධාර ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ ද? ඔව් ☐ නැත ☐

1. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම : ..............................................................................................................
..............................................................................................................
..............................................................................................................

ජාතික හැඳුනුම්පත් අංකය : ................................ ස්ථාවර දුරකථන අංකය: ...................................

( ජාතික හැඳුනුම්පතේ පිටපතක් අමුණන්න) ජංගම දුරකථන අංකය : ...................................

2. ලිපිනය : ..............................................................................................................
..............................................................................................................

3. ඉඩමේ නම : ..............................................................................................................

මානක සැලැස්මේ අංකය : ................................ බිම් කට්ටි අංකය : ...................................

තේ නැවත වගා / අළුත් වගා / පාළු සැපයීමේ ව්‍යාපෘතිය සඳහා

| | අක්කර | රූඩ් | පර්චස් |
|---|---|---|---|
| ඉඩමට අයත් මුළු බිම් ප්‍රමාණය | | | |
| තේ වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය | | | |
| ඉල්ලුම් කරන බිම් ප්‍රමාණය | | | |

4. ඉඩමේ පිහිටීම : දිස්ත්‍රික්කය : ...................................................

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | තේ පරීක්ෂක / ව්‍යාප්ති නිලධාරී කොට්ටාශය | ග්‍රාම නිලධාරී කොට්ඨාශය | ගම | තැපැල් කාර්යාලය |
|---|---|---|---|---|
| | | | | |

5. මෙම ඉඩම සඳහා සහනාධාර ලබාගෙන ඇතිනම් අවසාන වරට ලබාගත් අවසරපත්‍ර අංකය: ..............................................

6. වගා පුනරුත්තාපනය / පාළු සැපයීම සඳහා ඉල්ලුම් කරන්නේ නම් පමණක් සම්පූර්ණ කිරීම සඳහා (රිකිලි තේ ඉඩම් සඳහා පමණක් මෙම ආධාර ක්‍රමය ක්‍රියාත්මක වන අතර ඒකරාශී වූ හෝ විසිරි පාළු (තනි තනිව පවතින පාළු) වශයෙන් පිහිටි පාළු සඳහා ඉල්ලුම් කල හැකිය)

(i) පාළු සැපයීමට ඉල්ලුම්කරන තේ වගාවේ වයස : අවුරුදු ..........................................

(ii) ඉල්ලුම් කරන බම් ප්‍රමාණයේ සැපයීමට ඇති පාළු පැල ගණන : පැල ..........................................

(iii) එහි අක්කරයකට සාමාන්‍යයෙන් සැපයීමට ඇති පාළු පැල ගණන : පැල ..........................................

(iv) දැනට ඇති තේ වගාවේ පරතරය : අඩි ................ × අඩි ................

(v) තේ පඳුරු කප්පාදු කිරීමට අදහස් කරන වකවානුව, දිනය හා මාසය : 20 ..........................................

7. ඉඩමට ළඟා විය හැකි ගමන් මග (ළඟම ඇති නගරයේ සිට) ..............................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

8. ව්‍යාපෘතියේ සංවර්ධන සැලැස්ම.

1.තේ නැවත වගා / අළුත් වගා

| ක්‍රියාකාරකම | වැයවන මුදල (රු.) | අවසන් කිරීමට යෝජිත දින වකවානුව |
|---|---|---|
| උදුරා දැමීම | | |
| බිම් සැකසීම | | |
| පස පුනරුත්ථාපනය (මානා / CO 3 / ගෝතමාලා) | | |
| තේ පැල සිටුවීම | | |
| මුළු මුදල | | |

2. වගා පුනරුත්ථාපනය / පාළු සැපයීම.

| ක්‍රියාකාරකම | වැයවන මුදල (රු.) | අවසන් කිරීමට යෝජිත දින වකවානුව |
|---|---|---|
| කප්පාදුව | | |
| පැල සිටුවීම | | |
| මුළු මුදල | | |

3. තේ තවාන් සංවර්ධනය

| ක්‍රියාකාරකම | වැයවන මුදල (රු.) | අවසන් කිරීමට යෝජිත දින වකවානුව |
|---|---|---|
| තවාන් බිම හා කුටීරය සැකසීම | | |
| රිකිලි සිටුවීම (පස් සකස් කිරීම මළු පිරවීම ඇතුලුව) | | |
| මුළු මුදල | | |

4. තේ වගාවේ ජල සම්පාදනය.

| ක්‍රියාකාරකම | වැයවන මුදල (රු.) | අවසන් කිරීමට යෝජිත දින වකවානුව |
|---|---|---|
| ජල මූලාශ්‍රය ස්ථාපිත කිරීම | | |
| බට යොදා ජල සම්පාදන පද්ධතිය ස්ථාපිත කිරීම | | |
| මුළු මුදල | | |

ඉහත මා විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරිදි බවට සහතික වෙමි.

.............................................. ..............................................

දිනය ඉල්ලුම්කරුගේ අත්සන

---

**සැලකිය යුතුයි :** තේ නැවත වගාව , අළුත් වගාව හා පාළු සැපයීම සඳහා ණය මුදල් ලබාගත හැකි ආකාරය.

| ව්‍යාපෘති යෝජනා ක්‍රමය | සහනාධාර රහිත ණය මුදල (රු.) (හෙක්ටයාරයකට) | සහනාධාර සහිත | |
|---|---|---|---|
| | | ණය මුදල (රු.) | සහනාධාරය (රු.) |
| තේ නැවත වගාව | 2,500,000.00 | 2,000,000.00 | 500,000.00 |
| තේ අළුත් වගාව | 2,500,000.00 | 2,100,000.00 | 400,000.00 |
| පාළු සැපයීම | 400,000.00 | 200,000.00 | 200,000.00 |
| *** පාළු සහනාධාර ක්‍රමය යටතේ අධිකාරියේ සහනාධාර ලබා දෙන උපරිම බිම් ප්‍රමාණය අක්කර 2 ක් වන අතර අක්කරයකට ලබා දෙන උපරිම පැල ප්‍රමාණය පැල 1000 කි. | | | |

- තේ තවාන් සංවර්ධන කටයුතු සඳහා ණය ඉල්ලුම් කරන්නේ නම් දැනට වාණිජ තේ තවානක් වශයෙන් අධිකාරියේ ලියාපදිංචි වී ඇත්නම් එම සහතිකයේ පිටපතක් මෙම ඉල්ලුම්පත්‍රයට අමුණන්න.
- කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ තවාන් 500 ව්‍යාපෘතිය යටතේ සහනාධාර ලබාගෙන ඇත්නම් එම තවාන සඳහා මෙම ණය මුදල් ලබා ගත නොහැක.
- මෙම ඉඩම සඳහා සහනාධාර ලබාගැනීමට අපේක්ෂා කරන්නේනම් මෙම ඉල්ලුම්පතට අමතරව නියමිත සහනාධාර ඉල්ලුම්පත්‍රයක් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය වෙත ඉදිරිපත් කල යුතුය.

(කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණයි
ඉල්ලුම්කරු කිසිවක් සටහන් නොකල යුතුය)

**SMELoC - 02**

## 'සෞභාග්‍යයේ දැක්ම' කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය සවිබල ගැන්වීම

### කුඩා තේ වතු අංශය සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය

### කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

# මූලික පරීක්ෂණ වාර්තාව

| යොමු අංකය : | බිම් ප්‍රමාණය : | ණය යෝජනා ක්‍රමය : |
|---|---|---|

ඉල්ලුම්කරුගේ නම :..................................................................................................

ඉඩමේ නම : ..........................................................................................................

පරීක්ෂණය කළ දිනය : 20.............................................................................................

| | | |
|---|---|---|
| (1) (අ) | තේ වගා කිරීමට යෝජිත බිම් කොටසේ දැනට ඇති වගාවන් සහ තේ වගාවේ තත්ත්වය : | වගාව / වගාවන් : .................................<br>තේ වර්ගය :බීජ/රිකිලි තේ (ක්ලෝන) ....................<br>තේ වගාවේ වයස අවුරුදු :......................................<br>අක්කරයට ඇති පඳුරු ගණන : ..............................<br>වර්තමාන අස්වැන්න: වර්ෂයකට අක් : කි.ග්‍රෑ............ |
| (ආ) | පස සාරවත් කිරීමට තෘණ සිටුවා ඇත්නම් තෘණ වර්ගය, පරතරය හා සිටවූ දිනය : | ...........................................................<br>........................................................... |
| (ඇ) | මුඩු ඉඩමක් නම් ඒ බවද තේ වවා තිබූ ඉඩමක්නම් ඒ බවට ඇති සාධකද එහි වර්තමාන තත්ත්වය සඳහන් කරන්න. | ...........................................................<br>........................................................... |
| (2) | තේ වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය, එම තේ වගාවේ වයස හා තත්ත්වය : | අක්..........රූඩ්...........පර්............ හෙක්.............<br>වයස:බීජ තේ:අවු ............රිකිලි තේ අවු. ..............<br>බිම් ප්‍රමාණය අ.........රූ..........පර්.........හෙක්......... |
| (3) (අ) | බිම් කොටසේ දැනට ඇති වගාව රිකිලි තේ නම් එය අසාර්ථක වීමට හේතු : | ...........................................................<br>...........................................................<br>........................................................... |
| (ආ) | තේ වගාව සහිත බිම් කොටසේ රෝග පලිබෝධ හානි තිබේද? | ........................................................... |
| (4) | බිම් කොටසේ ස්වභාවය :<br>එහි බෑස්ම ප්‍රමාණය දළ වශයෙන් :<br>පසේ ස්වභාවය :<br>සාමාන්‍ය පසේ ගැඹුර : | සමතලා / ගොඩැලිකාර / සාමාන්‍ය බෑවුම් / තද බෑවුම්<br>බෑස්ම සියයට : ...........................................<br>වැලි ලෝම / මැටි ලෝම / බොරළු අධික / මැටි අධික<br>මීටර් ..........................අඩි............................ |
| (5) | තේ වගාවට නුසුදුසු බිම් කොටස් සහ එයට අයත් බිම් ප්‍රමාණයන් :<br>(i) ගල්තලා/තද ස්ථර/ජලය රඳන/තද බෑවුම්<br>(ii) උදුරා ඉවත් නොකරන ලද ගස්/වැල් මහ මිශ්‍ර වගා (සඳහන් කරන්න)<br>(iii) වෙනත් නුසුදුසු කොටස් * (සඳහන් කරන්න)<br>අඩු කිරීම් එකතුව<br>ඉහත * (i) සහ ( ii) යටතේ විස්තර | <br><br>හෙක්..............(අක්...........රූ............පර්...........)<br>හෙක්..............(අක්...........රූ............පර්...........)<br>හෙක්..............(අක්...........රූ............පර්...........)<br>........................................................... |

| | | |
|---|---|---|
| | බෝග පුනරුත්ථාපනය (පාළු සැපයීම)<br>සම්බන්ධයෙන් තොරතුරු (ඉල්ලුම් කර ඇත්නම්)<br>තේ වගාව කප්පාදු කිරීම :<br>අවසාන වරට කප්පාදුව :<br>මෙවර කප්පාදුව නියමිත කාල වකවානුව :<br>මෙවර දැනටමත් කප්පාදු කර ඇත්නම් නිර්දේශය : | <br><br>කප්පාදු කර නැත/ඇත.<br>..........වැනි කප්පාදුව වර්ෂය 20........මාසය ........<br>වර්ෂය 20.................. මාසය.....................<br>සතුටුදායකයි / සතුටුදායක නැත. |
| 6.2 | තේ වගා කර ඇති පරතරය :<br>පාළු රහිතව තිබිය යුතු මුළු පඳුරු ගණන :<br>දැනට ඇති පාළු පඳුරු :<br>පාළු පිහිටා ඇත්තේ : | අඩි ........................ × ..............................<br>.................................................................<br>මුළු සංඛ්‍යාව ............ අක්කරයට / පඳුරු...............<br>ඒකරාශී වූ කොටස්වල/තනි පාළු (විසිරි ඇති පරිදි) |
| 6.3 | පස සංරක්ෂණය හා අනෙකුත් කෘෂිකාර්මික කටයුතු : | හරස් කානු : ඇත/නැත ප්‍රමාණවත්/ප්‍රමාණවත් නැත.<br>ගල්වැටි : ඇත/නැත ප්‍රමාණවත්/ප්‍රමාණවත් නැත.<br>ජීව වැටි : ඇත/නැත ප්‍රමාණවත්/ප්‍රමාණවත් නැත.<br>සෙවන වගාව: ප්‍රමාණවත්/ප්‍රමාණවත් නැත.<br>අනෙකුත් කෘෂිකාර්මික කටයුතු : ප්‍රමාණවත් /<br>ප්‍රමාණවත් නැත |
| 6.4 | යෝජිත මුළු බිම් කොටස මෙම වගා ක්‍රමයට යොග්‍යද?<br>කොටසක් හෝ නැවත වගාවට යෝග්‍යද? | ඔව් / නැත<br>නැවත වගාව අක්කර ...........රූ...........පර් .......... |
| (7) | මෙම ඉඩම සඳහා කලින් ලබාදී ඇති අවසර පත්‍ර අංක සහ නිකුත් කල දිනයන් : | .................................................................<br>................................................................. |
| | මෙම ඉඩමේ තේ වගා කිරීම පිළිබඳ ඔබගේ නිර්දේශය<br>ණය යෝජනා ක්‍රමය හා බිම් ප්‍රමාණය<br><br>බෝග පුනරුත්ථාපනය / පාළු සැපයීම සඳහා නිර්දේශය<br>(ඉල්ලුම් කර ඇත්නම්)<br><br>පස සාරවත් කිරීම :<br><br>වගාව සඳහා තේ පැල සපයා ගන්නා ආකාරය :<br><br>ජල සම්පාදනය<br><br>(ණය නිර්දේශ නොකරන්නේ නම් ඊට හේතු ) | නිර්දේශ කරමි / නිර්දේශ නොකරමි.<br>ණය යෝජනා ක්‍රමය : ..........................................<br>බිම් ප්‍රමාණය : හෙක් ........(අක්.......රූ.......පර්.......)<br><br>පැල ගණන ..................................................<br><br>කොම්පෝස්ට් යෙදීමෙන් / තෘණ සිටුවා මාස 18<br>නඩත්තු කිරීමෙන්<br><br>.................................................................<br><br>ජල මූලාශ්‍රය ....................................<br>නියං තත්වයට මුහුණ දීම සඳහා ජල මූලාශ්‍රය<br>ප්‍රමාණවත් / ප්‍රමාණවත් නැත<br><br>................................................................. |
| | බිම් කොටස් සම්බන්ධයෙන් සඳහන් කල හැකි වෙනත් කරුණු:<br>(සපයා ඇති ඉඩකඩ ප්‍රමාණවත් නොවේ නම් වෙනත් කොළයක් අමුණන්න) | .................................................................<br>.................................................................<br>................................................................. |
| (10) | පරීක්ෂණයට ඉදිරිපත් වූ අයගේ නම : | ................................................................. |

ඉල්ලුම්පත්‍ර අංක ...............ට යොමුව මෙම ඉඩමට පැමිණ කරන ලද පරීක්ෂණය පරිදි මෙම වාර්තාව ඉදිරිපත් කරමි. (අදාල නොවන වචන කපා හරින්න)

.........................................................

තේ පරීක්ෂක / ව්‍යාප්ති නිලධාරීගේ අත්සන

නම.........................................................

දිනය.........................................................

නිල මුද්‍රාව

# 'සෞභාග්‍යයේ දැක්ම' කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය සවිබල ගැන්වීම

## කුඩා තේ වතු අංශය සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය

## කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

| | |
|---|---|
| ණය යෝජනා ක්‍රමය: | |
| යොමු අංකය: | |

## පස පුනරුජ්ජීවනය පරීක්ෂණ වාර්තාව

ඉල්ලුම්කරුගේ නම :................................................................................................

ඉඩමේ නම :................................................................................................

ඉඩම පිහිටි ග්‍රාම නිලධාරී වසම :................................................................................

අනුමත කල බිම් ප්‍රමාණය හෙක්ටයාර: අක්: රූඩ්: පර්:

පරීක්ෂණයට ඉඩම් පෙන්වූ අයිතිකරු / නියෝජිතයාගේ නම :..........................................................

පරීක්ෂණය කල දිනය හා වේලාව : 20..................................පෙ.ව. / ප.ව..................................................

| | |
|---|---|
| **1.** උදුරා දැමීම / පස සංරක්ෂණ පරීක්ෂණය:<br>**(i)** උදුරා දැමීම සහ පැරණි මුල් ඉවත් කිරීම නිර්දේශිත පරිදි නිමකර තිබේද? ඔබගේ නිරීක්ෂණය<br>**(ii)** උදුරා නොමැති ගස් වර්ග සංඛ්‍යාව සහ ආවරණ බිම් ප්‍රමාණය:<br><br>**(iii)** පස සංරක්ෂණය සඳහා:<br>(අ) ඉඩමේ බෑවුමට සරිලන පරිදි යොදා ඇති හරස් කානු නෙත්ති කානු හා ගල්වැටි / බැම් ප්‍රමාණවත්ද?<br><br>(ආ) කානු ගැටි ආරක්ෂා කිරීමට පියවර ගෙන තිබේද?<br>(ඇ) ඉහත (අ) සහ (ආ) යටතේ ප්‍රමාණවත් නොවේ නම් ඔබගේ නිරීක්ෂණය:<br><br>**(iv)** පස සාරවත් කිරීමට තෘණ සිටුවා තිබේනම් සිටුවන ලද<br><br>**(v)** වගා කිරීමට පැල සපයා ගන්නා අන්දම : | ................................................................<br>ගස් වර්ග / සංඛ්‍යාව / ආවරණ බිම් ප්‍රමාණය<br><br>හරස් කානු ..........................................................<br>නෙත්ති කානු ..........................................................<br>ගල්වැටි / බැම් ..........................................................<br><br>ඇත / නැත<br><br>................................................................<br><br>දිනය 20................ වර්ගය : මානා / ගෝතමාලා/CO3<br>පරතරය:..............................<br>*තමාගේම තවානෙන්..........................................<br>..........................................................තවානෙන් |
| *නොයෙදන වගන්ති කපා හරින්න.<br><br>දිනය : .................................. | ................................................................<br>තේ පරීක්ෂක / ව්‍යාප්ති නිලධාරීගේ අත්සන<br>නම :<br>දිනය :<br>නිල මුද්‍රාව |

SMELoC – 02(2)

## 'සෞභාග්‍යයේ දැක්ම' කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය සවිබල ගැන්වීම

### කුඩා තේ වතු අංශය සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය

### කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

| | |
|---|---|
| ණය යෝජනා ක්‍රමය: | |
| යොමු අංකය: | |

## ගෙවීම් පරීක්ෂණ වාර්තාව

ඉල්ලුම්කරුගේ නම :........................................................................................................................

ඉඩමේ නම :........................................................................................................................

ඉඩම පිහිටි ග්‍රාම නිලධාරී වසම:

අනුමත කල බිම් ප්‍රමාණය හෙක්ටයාර: අක්: රූඩ්: පර්:

පරීක්ෂණයට ඉඩම් පෙන්වූ අයිතිකරු / නියෝජිතයාගේ නම:

පරීක්ෂණය කල දිනය හා වේලාව : 20..................................පෙ.ව. / ප.ව...................................................

| | |
|---|---|
| **1.** තේ වගාව හා වගාවේ නඩත්තු කිරීම :<br>**1.1.** රිකිලි තේ වගා කිරීමේ පරීක්ෂණය<br>(i) පස පුනරුජ්ජීවනය සහිත නැවත වගා ඉඩමක් නම්<br>(ii) තේ පැල සිටුවා අවසන් කල දිනය :<br>(iii) පැල අතර පරතරය (පේලි හා පැල අතර) :<br>(iv) වගා කර ඇති බිම් ප්‍රමාණය අනුව නඩත්තු කර ඇති පැල ගණන (ක්ලෝන අනුව)<br>(v) සිටුවා ඇති රිකිලි තේ පැලවල තත්ත්වය.<br>(vi) සෙවන ගස්<br>(vii) වසුන් යොදා තිබේද? එසේ නම් ඒවා ප්‍රමාණවත්ද?<br>(viii) වගා කරන ලද බිම් ප්‍රමාණයේ සාමාන්‍ය කෘෂි කාර්මික තත්ත්වය පිලිබඳ ඔබගේ නිරීක්ෂණය : | පසේ තත්වය : සතුටුදායකයි / සතුටුදායක නැත<br>......................................................................<br>අඩි ................................ අගල් ..............................<br>ක්ලෝන/වගා බිම් ප්‍රමාණය/සාර්ථක පැල/පාළු පැල<br>වයස :<br>වර්ධනය * සතුටුදායකයි / සතුටුදායක නැත.<br>සෙවන ගස් වර්ගය: පරතරය:<br>වසුන් : *යොදා ඇත / යොදා නැත.<br>* ප්‍රමාණවත් / ප්‍රමාණවත් නොවේ.<br>වර්ධනය : * සතුටුදායකයි / සතුටුදායක නැත. |
| ගෙවීම් නිර්දේශය : | නිර්දේශිත බිම් ප්‍රමාණය<br>අක්......... රූ. .......... පර්. .........(හෙක්ටයාර.........)<br>නිර්දේශිත පැල ප්‍රමාණය : ............................ |
| *නොයෙදන වගන්ති කපා හරින්න.<br>දිනය : ................................... | ...........................................................<br>තේ පරීක්ෂක / ව්‍යාප්ති නිලධාරීගේ අත්සන<br>නම :<br>දිනය :<br>නිල මුද්‍රාව |

SMELoC - 03

| යොමු අංකය:- |
|---|

.............................................මයා/මිය

.............................................

.............................................

ගරුතර ස්වාමීන්වහන්ස / ප්‍රිය මහත්මයාණෙනි / මහත්මියනි,

<u>කුඩා තේ වතු අංශය සඳහා කුඩා තේ හා මධ්‍ය පරිමාන ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය යටතේ</u>

<u>තේ අළුත් වගාවට / නැවත වගාවට ඉදිරි කටයුතු දැනුම් දීම.</u>

<u>ඉඩමේ නම:-</u>.........................................................................................................................

යථෝක්ත ණය යෝජනා ක්‍රමය යටතේ තේ අළුත් වගාව / නැවත වගාව සඳහා අක්:................ රූ:................ පර්:................ බිම ප්‍රමාණය සුදුසු බවට නිර්දේශ කරනු ලැබේ. ඒ අනුව තේ අළුත් වගාව හා නැවත වගාව සම්බන්ධව පහත දක්වා ඇති පරිදි වගා කටයුතු සිදුකල යුතු බව දැනුම් දෙමි.

1. <u>උදුරා දැමීම / පස සංරක්ෂණය:</u>
   තේ වගාව සඳහා හඳුනා ගන්නා ලද බිම් කොටසේ දැනට තිබෙන ගස් කොලන් / තේ පඳුරු උදුරා මුල්ලුකොට මුල් ආදිය ඉවත් කිරීම, ඉඩමේ බෑවුම් අනුව අවශ්‍ය පරිදි කානු, ගල්වැටි පස සංරක්ෂණ කටයුතු නිම කිරීම.
2. <u>පාංශු පුනරුත්ථාපනය.</u>
   පස පුනරුත්ථාපනය සඳහා මානා / ගෝතමාලා නිර්දේශ පරතරයට (මානා - 2 '× 6" ගෝතමාලා - 2' × 1' ) වගා කොට මාස 18 නඩත්තු කිරීම හෝ පහතරට කලාපයේ නම් CO-3 (හයිබ්‍රිඩ් නේපියර්) තෘණ 2' × 1' පරතයට සිටුවා මාස 12 ක කාලයක් නඩත්තු කිරීම කළ යුතුය. තෘණ වගා කාලය තුල නියමිත ලෙස පොහොර යොදා නඩත්තු කරමින් මාස 3-4 කට වරක් කපා පස මත අතුරා දැමිය යුතුය. (තේ නැවත වගා කරන ඉඩම් වල ප්‍රමානවත් පාංශු සාරවත් බවක් පවතින බවට තේ පර්යෝෂණායතනයේ පාංශු තත්ත්වය දර්ශකයට (SQI) අනුව තහවුරු කරන්නේ නම් පස පුනරුත්ථාපනයෙන් තොරව තේ පැල සිටවීමට හැකිය.)
3. <u>තේ පැල සිටුවීම.</u>
   ලියාපදිංචි කල තවානකින් හෝ අනුමත ක්ලෝනවල රිකිලි යොදා ඔබ ඉඩමේ පිහිටවූ තවානකින් ලබාගත් පොලිතීන් බඳුන්වල පැල කළ රිකිලි පැල යොදා සමෝච්ඡ ක්‍රමයට 4'X 2'පරතරයට තේ පැල සිටුවීම සම්පූර්ණ කල යුතුය. හෙක්ටයාරයකට තේ පැල 12,000 (අක්කරයකට 4900ක්) අවම වශයෙන් සිටුවා තිබිය යුතුය.

වැදගත්:

- වගා ප්‍රදේශය අනුව නිර්දේශිත ටී.ආර්.අයි 3000 හා ටී.ආර්.අයි 4000 කාණ්ඩවල තේ පැල වගාව සඳහා යොදා ගැනීමට දැනුම්දෙනු ලබන අතර කුමන හේතුවක් නිසාවත් ටී.ආර්. 2023 මුහුදු මට්ටමේ සිට අඩි 2000 ට වඩා පහත් ප්‍රදේශවල වගා නොකළ යුතුය.

- පස සාරවත් කිරීම සඳහා නිර්දේශිත පරිදි තෘණ සිටුවීම හෝ තේ පර්යේෂණායතනය මගින් පාංශු තත්ත්ව දර්ශකයට (SQI) අනුව පසෙහි සාරවත් භාවය තහවුරු කර නොමැති නම් පැල සිටුවීමට අදාල ණය වාරිකය ගෙවීම නිර්දේශ කිරීමට නොහැකි බව ද දැනුම් දෙමි.

මෙයට විශ්වාසී වූ,

ප්‍රාදේශීය කළමනාකරු

පිටපත : 1.) කළමනාකරු ........................................................ ශාඛාව
........................................................ බැංකුව